නිශ්චලත්වයේ කථනය

මණ්ඩාවල පඤ්ඤාවංස හිමි
එකාර්ට් ටොලේගේ Stillness Speaks
පරිවර්තනය අමිතා කුමුදිනී හේවාවිතාරණ



Power of Now නම් වන ලෝකයේ මහත් හඬක් ඇති කළ ග්‍රන්ථය සැනසීමට මඟ නමින් සිය පළමු පරිවර්තනය ඉදිරිපත් කළ පරිවර්තිකාව දැන් එම ලේඛකයාගේ ම තවත් කෘතියක් අපට ප්‍රදානය කරයි.

සිය පළමු පරිවර්තනය සාර්ථකව ඉටුකළ ලේකාව තුළ පරිවර්තනය යනු කුමක්ද යන්න පිළිබඳව මනා වැටහීමක් තිබෙන බව පෙනී යයි. විශේෂයෙන් ම පළමු පරිවර්තනය සාර්ථක වීම යනු කලාතුරකින් සිදුවන්නකි. ඊටත් වඩා විදේශ සරසවියක විද්‍යා ආචාර්යවරියක විසින් සිංහල පරිවර්තනයක් කිරීම වඩාත් විරළ සිදුවීමකි. පරිවර්තනය යන්න. විශේෂයෙන් සාහිත්‍ය හෝ දර්ශනය පරිවර්තනය කිරීම කෙතරම් අසීරු කාර්යයක් දැයි යන්න අප වටහා ගත යුතුය. මේ පිළිබඳව ප්‍රකට දාර්ශනික කවියකු වන ඛලීල් ජිබ්රාන් තුමා මෙසේ සඳහන් කරයි. 'පරිවර්තන කාර්යය යනු සැබෑ කලාවකි. ඒ වනාහි එක් බසක අසිරිය තවත් බසක අසිරිය බවට පෙරළීමේ ප්‍රතිනිර්මාණ ක්‍රියාවලියයි.

ඇගේ පළමු පරිවර්තනය එම අභියෝගය ජයගෙන තිබුණු බව අපි දුටිමු. දාර්ශනික කෘතියක් පරිවර්තනයේ දී මුහුණ දෙන්නට සිදුවන ප්‍රධාන ගැටළුව නම් සුදුසු වචනය තෝරා ගැනීමයි. ඇය ඇගේ කෘති දෙකේ දී ම එය බොහෝ දුරට සාර්ථක ව සිදුකර තිබෙන බව පෙනී යයි. පරිවර්තිකාව මෙහිලා සමත් වන්නේ වෙන කිසිවක් නිසා නොව ඇය මෙම මොහොත තුළ දිවිගෙවමින් ආධ්‍යාත්මික මාර්ගයට අවතීර්ණය වී සිටින බැවිණියි මට හැඟේ.

එකාර්ට් ටොලේ යනු වත්මන් ලෝකයේ සිටින සත්‍යාවබෝධය ලැබූ උතුමෙකි. (සමහර කෙනෙකුට මෙය තරමක් මතභේදයට තුඩුදෙන ප්‍රකාශනයක් විය හැකිය.) කෙසේ නමුත් එතුමා ලියන කියන කාරණා වලින් ද එය එසේ ම යැයි හැඟෙන බව කිවයුතුය. දිවිහානිකර ගන්නට පවා සරසී සිටි මෙතුමාට එක් රාත්‍රියක දී අද්වෛතය අවබෝධ වූ බව හෙවත් විශ්වය සහ තමා යනු දෙකක් නොව එකක් බවත්, සැබෑ සංහිඳියාව පහළවූ බවත් සීමා බන්ධන විරහිත මෙත්තා-කරුණාවෙන් සිත පිරීගිය බවත් එතුමා සිය පළමු පොතේ සඳහන් කරයි. (සත්‍යාවබෝධය වනාහි බෞද්ධයන් විසින් පමණක් ම ලැබිය හැකි තත්වයකැයි යන විශ්වාසය දැඩිව පවතින සමාජයක දී වෙනත් ඇදහිලි සහිත සංස්කෘතියක කෙනෙකුට එම අවස්ථාවට පත්විය හැකියැයි කීම තරමක් බරපතල ප්‍රකාශයක් වෙයි. පහත සඳහන් කාරණය කෙරෙහි අවධානය යොමුකරන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි: වස දී මරණයට කැපකළ සොක්‍රටීස් තුමා බලන්නට, එතුමාගේ මරණ දඬුවම ක්‍රියාත්මක කරන්නට හෝරා කීපයකට කලින් එතුමාගේ ගෝලයෙක් සිරගෙදරට පැමිණෙයි. තව පැය කීපයකින් මරණයට කැපවන්නට සිටින එතුමා සුව නින්දේ සිටී! ටික වේලාවකින් අවදිවූ එතුමා ගෝලයාගෙන් මෙසේ විමසයි:

“ඔබ ආවෙ දැන් ද?“

“නැහැ, මා එන විට ඔබ තුමා නින්දේ හිටියෙ.“

“එසේ නම් ඇයි ඔබ මා අවදි නො කළෙ?“

“මා ඔබ තුමාගේ නින්දේ සුන්දරත්වය දෙස බලගෙන හිටිය!“

හෝරා කීපයක් තුළ මරණයට කැප වන්නට සිටින, බිය සහ ආශාව පිරි සාමාන්‍ය මිනිසකුට එසේ නින්ද යතියි ඔබ සිතන්නෙහි ද?මෙම කාරණාව වෙන ම කතාකළ යුතු වන්නකි.)

ලොව පහළ වන සියලු පසේ බුදුවරු බෞද්ධ ද?

බුදුදහමට අනුව අපේ හදවත වනාහි බබළමින් පවතින්නකි. **"පභස්සරමිදං භික්ඛවේ චිත්තං, තංචකෝ ආගන්තුකේහි උපක්කිලේසේහි උපකිලිට්ඨං.** "එය බාහිරින් පැමිණෙන කෙලෙස් මලින් අපිරිසිදු වී ඇත."(මහායාන බුදු දහමේ සියලු දෙනා ම බෝසතුන්යැයි හඳුන් වන්නේ මෙම අරුතිනි. හිට්ලර්, දේවදත්ත තුළ ද බුද්ධ ස්වභාවය පවතී)

එකාර්ට් ටොලේ සඳහන් කරන නිශ්චලත්වය යනු මෙම ප්‍රභාස්වර හදවත ම ද?

පෙරදිග දර්ශනයේ දී **මුනි** යන වදන ඉතා වැදගත්ය. ඉංදියාව, චීනය ආදි පෙරදිග රටවල සිටියෝ මුනිවරයෝය; (සාමාන්‍යයෙන් බටහිර රටවල වැඩිපුර චින්තකයන් ගැන සඳහන් වේ; සමහර අය සොක්‍රටීස් වැනි උතුමන් ද චින්තක ගණයට දමා කතා කළත් එතුමා මුනිවරයෙකි.) නිහැඬියාව තුළ සිටින්නෝය. බුදුන්වහන්සේ 'ශාක්‍යමුනි' නමින් හඳුන්වන්නේ එබැවිනි. ලඕට්ස උතුමා ද මුනිවරයෙකි. මහාවීර උතුමා ද මුනිවරයෙකි. මුනිවරු නිහැඬියාව තුළ දිවිගෙවන අතර, එම නිහැඬියාව තුළින් ම විශ්වය හා සම්බන්ධවෙති.

නිහැඬියාව සහ මෙම මොහොත එකට යන දෙකකි. නිහැඬියාව පාදක කරගෙන මෙම මොහොත කරා පැමිණීම භාවනාවෙහි පදනමයි. තවත් ආකාරයකට මෙ මගින් **කාලය** සහ **අවකාශය** යන දෙක එක්කිරීම ද සිදුවේ. සතියෙන් ආශ්වාස කරද්දී "මේ දැන් මෙතැන" සිටින බැවින් කාලය සහ අවකාශය වෙන් නොවේ. මෙම කාරණය ආධ්‍යාත්මික ආචාර්යවරුන් සේ ම උසස් සංගීතඥයෝ කලාකරුවෝ දකිති. එපමණක් නොව විද්‍යාඥයෝ සිය සොයැගැනීම් කරන විට ද නිහැඬියාව සහ මෙම මොහොත තුළ සිටිමින්, සිතිවිල්ලෙන් තොර මොහොතක දී එම සොයාගැනීම් සිදුවේ. ප්‍රංශයේ හිතවතකුට ලිපියක් ලියන ඇල්බර්ට් අයින්ස්ටයින් සිය සොයා ගැනීම් දෙකේ ම ප්‍රතිඵල තමාට ලැබුණේ තමා යම් ආකාරයක සමාධියක සිටියදී බව කියයි: එකක දී හෙතෙම වයලීනය වාදනය කරමින් සිට ඇති අතර, අනික් සොයාගැනීමේ දී උයනක් තුළ විහඟ නදට සවන් දෙමින් සිට ඇත. වෙනත් ආකාරයකට කියන්නේ නම් එය 'පහළවී' ඇත්තේ ඔහු බුද්ධිය (intellect) ප්‍රයෝජනයට නො ගනිමින් සිටි අවස්ථාවක දීය! උසස් සංගීතඥයකු නිමැවුමක් කරද්දී බුද්ධිය භාවිතා කරතියි කිසි සේත්ම සිතිය නො හැකිය. "වාදනයක දී වඩා වැදගත් වන්නේ ස්වර දෙකක් අතර තිබෙන නිහැඬියාවයි" යනුවෙන් යම් සංගීතඥයකු ප්‍රකාශ කර ඇත්තේ එබැවින් වියහැකිය.

"ගතේ, ඨිතේ, නිසින්නේ, සුත්තේ, ජාගරේ, භාසිතේ, තුන්හීභාවේ සතිසම්පජානකාරී හෝති." යනුවෙන් බුදුන් වහන්සේ දිවියේ සෑම ඉරියව්වකදී ම සතියෙන් සිටින්නැයි හෙවත් 'මෙම මොහොතේ' ම දිවි ගෙවන්නැයි අපට උපදෙස් දෙති.

ජේසුස් වහන්සේ මෙම මොහොත අවධාරණය කරන ආකාරය බලන්න:

"එබැවින් හෙට පිළිබඳ ව සිතිවිලි වලින් මිදෙන්න: හෙට ඇතිවන සිතිවිලි හෙට තිබෙන දේවල් පිළිබඳවය."(මැතිව් 6:34)

අර්වින් ෂ්රඩිඟර් විද්‍යාඥයා මෙසේ කියයි:

"සදහට ම සහ නිරන්තරයෙන් ම පවත්නේ **දැන්** පමණි; ඒ එක ම සහ අවිනශ්වර **දැන්**ය; කිසි ම අවසානයක් නොමැති එක ම දෙය **දැන්** හෙවත් **මෙම මොහොත** වෙයි!"

"මෙම මොහොතේ අනන්තය දකින්!" යැයි විලියම් බ්ලේක් කවියා කියන්නේ මෙය ම නොවේද?

ඛලීල් ජිබ්රාන් තුමා 'මුනිවර අසපුව' කෘතියෙහි දී මෙම මොහොත දකින ආකාරය දෙස බලන්න:

"එසේ නම් මෙම පස් වලින් මිටක් අතට ගන්න, නුඹ ඒ තුළ බීජයක් නොහොත් පනුවෙකු දකින්නෙහිද? නුඹේ අත ප්‍රමාණවත් පරිදි විශාල නම්, ඉවසිලිවන්ත නම්, එම බීජය වනාන්තරයක් බවට පත්විය හැක්කේය. එලෙසින් ම එම පනුවා සුරඟනන් පිරිසක් බවට පත්විය හැක්කේය. බීජ වනාන්තර බවට පරිවර්තනය කරන්නාවූ ද, පනුවන් සුරඟනන් බවට පරිවර්තනය කරන්නාවූ ද, අවුරුදු කාල මෙම **එළැඹි මොහොතේ**, මෙම **ක්ෂණයේ** හෙවත් මෙම **දැන්** හි කොටස් කාරයන් වන බව අමතක නො කරන්න. සියලු ම අවුරුදු කාල මෙම **එළැඹි මොහොත, ක්ෂණය** හෙවත් **දැන්** වන්නේය."

නිහැඬියාව සහ **මෙම මොහොත** ග්‍රහණය කරගන්නේ බුද්ධියෙන් නොව. අපේ සමහර බොදුනු බුද්ධිමතුන් භාවනාව තර්කය සමග බද්ධවී තිබෙන දෙයක් ලෙස දකින බව පෙනේ. එය එහෙම පිටින් ම වැරදි පිළිගැනීමකි. සත්‍යයට එරෙහිව යාමකි.

මෙම මොහොත කොපමණ ප්‍රබල ද යන්න දැනගනු උදෙසා භාවනාව ප්‍රගුණකළ යුතුමය.

එකාර්ට් ටොලේ කතා කරන මෙම නිශ්චලත්වය ස්පර්ශ කළහැකි එක ම ආකාරය මෙම මොහොත ග්‍රහණය කිරීමයි. මෙම මොහොත ග්‍රහණය කරගැනීමේ ක්‍රියාවලිය යනු **මුනිවත** හෙවත් **නිහැඬියාව** කරා යාමයි. මෙම මොහොත තුළ සතියෙන් සිටියදී ඊළඟට මම හෙවත් අස්මිමානය අහෝසි වන්නට පටන් ගනී. මෙහිදී බුදුන් වහන්සේ භාවිතා කළ **සතිය** යන අතිශය වැදගත් වන වචනය අපට නැතුව ම බැරි දෙයක් වෙයි. මෙම වචනය බටහිර භාෂාවන්ට පරිවර්තනය කිරීමේදී වචන එකක් හෝ දෙකක් යොදා ගන්නට හෝ අලුත් යෙදුමක ආකාරයෙන් භාවිතා කරන්නට හෝ සිදුවෙයි.(උදා: තිච් ඤතාන් යතිවරයා ප්‍රංශ බසින් එය Pleine conscience වශයෙන් භාවිතා කරයි.) අද දවසේ බටහිර ලේඛකයෝ මෙම වචනයෙහි අරුත ගැබ්වෙන නවකථා පවා ලියමින් සිටිති. උදා: පාඔලෝ කොය්යෝගේ Veronicka Decide Morrer හෙවත් වෙරෝනිකා මැරෙන්ඩ තීරණය කරයි කෘතිය දැක්විය හැකිය. දිවිනසා ගන්ට තැත්කළ වෙරෝනිකාගේ වෑයම අසාර්ථක වූ පසු ඕ මරණ සතියෙන් යුතුව ජීවත් වන්නට පටන් ගනී. එසේ ජීවත්වන හැම මොහොතක ම ඇය භීතියකින් තොරව මරණ සතියෙන් දිවිගෙවයි. (එය සිංහලට පෙරළීමේ දී යොදා ඇති වචනය **සතිය** වියයුතු වුවත් පරිවර්තක භවතා 'දැනුවත් භාවය' යන්න භාවිතා කර තිබීම කණගාටුවට කරුණකි!)

මහා සංගීතඥ මොසාර්ට් සිය පියාට ලියූ අවසන් ලිපියෙහි තමා බියකින් චකිතයකින් තොරව හැම රැයක ම නින්දට යද්දී මරණය සිහිකරන බව ලියා තිබුණු බව මෙම මොහොතේ මගේ සිහියට එයි!

සිත සිතිවලිවලින් මුදවාලීම සඳහා **සතිය** භාවිතා වෙයි. සිතිවිලි වලින් මිදීම තුළින් හෙවත් සිත නැතිකිරීම තුළින් විමුක්තිය ලැබෙයි.

මෙම අවස්ථාවන් එකක් වත් **බුද්ධිය** හෝ **තර්කය** තුළින් ග්‍රහණය කරගත නො හැකිය. ඒ සඳහා අනිවාර්යයෙන් ම බවුන් වැඩිය යුතුයි. බවුන් වඩන්නෝ ම **මෙම මොහොතට අවසානයක් නොමැති** ආකාරය දකිති. බුද්ධිමය ව්‍යායාමය බුදුන් වහන්සේ හෝ වෙනත් කිසිදු ආධ්‍යාත්මික මාර්ගෝපදේශකයකු අනුදන්නේ නැත.

මෙම පූර්ව හැඳින්වීම් සමූහය ඔබ වෙත ගෙන ආවේ ''නිශ්චලත්වයේ කථනය'' තුළට ප්‍රවේශයක් පරිද්දෙනි.

අපගේ පරිවර්තිකාව **සතිය** යන්න මනාව වටහාගෙන තිබෙන බව ඈ මෙම කතුවරයාගේ කෘති දෙකක් ම සිංහලට පෙරළීමට උනන්දුවීම තුළින් අපට දැකගත හැකිය. භාවනා මාර්ගයට අවතීරණය නොවූ කෙනෙකු මෙවන් කෘතියක් පරිවර්තනයට ඉදිරිපත් වෙතියි සිතිය නොහැකිය. එවැන්නකු අතින් මෙවන් පොතක් පරිවර්තනය වුවත් එය සාර්ථක වෙතියි සිතන්නට නොහැකිය. ඇගේ පරිවර්තන දෙක සාර්ථක වන්නේ ඈ 'මගට පිළිපන්' කෙනෙකු වන නිසා යැයි මම උදක් ම විශ්වාස කරමි.

එකාර්ට් ටොලේ මෙසේ ලියයි: ''නිශ්ශබ්දතාවයට සවන්දීමෙන් ඔබ තුළ ඇති නිශ්චලත්වය අවදි වෙනව.'' ('නිහැඬියාවට සවන් දීමෙන් ඔබ තුළ ඇති සංහිඳියාව අවදි වේ' යනුවෙන් මා අතින් මෙය ලියවෙන්නට තිබුණි!)

එතුමා තවදුරටත්: ''ඔබ අවට ඇති නිශ්ශබ්දතාවය ගැන සැළකිලිමත් වන මොහොතේ දී ඔබ සිතන්නේ නැති බව ඔබට පෙනෙයි. ඔබ තුළ දැකීමක් මිස සිතීමක් සිදුවන්නේ නැහැ.''

''ඔබ සංවේදනය කරන දෙය හා ඔබ අතර ඒකීයත්වයක් දැනෙනව. ඔබ හා සෑම දෙයක් අතර ම ඇති ඒකීයත්වය දැනීම යනු මෛත්‍රියයි/ආදරයයි.''

බුදුදහමේ කරුණාව සහ ප්‍රඥාව යන දෙකාරණය එකට ගමන් කරන්නකි. බෝමැඩ දී බුදුන්වහන්සේ තුළ පහළවූ ප්‍රඥාවෙහි එක් කාරණයක් නම් තමන් වහන්සේ සහ විශ්වය එකිනෙකට බැඳී පවතින බවයි. විශ්වය සහ තමන් එකක් නම් ඉබේ ම විශ්වය කෙරෙහි මෙත්තා-කරුණාව පහළවීම ස්වාභාවික වෙයි. බුදුදහමේ කරුණාව සහ ප්‍රඥාව එකිනෙකට අනුපූරක දෙකක් වන්නේ එබැවිනි.

සිතිවිලි මගින් සිදුවන ඇබැද්දියක් නම් සත්‍යය කැබලිවලට කැඩීමයි; සංකල්ප නමැති කැබලිවලට කඩා දැමීමයි.

ප්‍රඥාව යනු සිතීමේ ප්‍රතිඵලයක් නොවෙයි. මීට ඉහතින් දැක්වූ අයින්ස්ටයින්ගේ සොයැගැනීම් දෙක සිදුවූ ආකාරය මෙනෙහි කිරීමෙන් එය පහසුවෙන් වටහාගත හැකිය.

“අප පත්වන මුලාව නම් අප තුළ උපදින සිතුවිලි අප ය යනුවෙන් වටහා ගන්නට පටන් ගැනීමයි. දෘෂ්ටි (ආගමික, දේශපාලන, විද්‍යාත්මක) ඇති වන්නේ සිතිවිලිවලට යථාර්ථය හෝ සත්‍යය හෝ ගොනුකර ගතහැකි යැයි යන වැරදි විශ්වාසය තුළිනුයි. දෘෂ්ටි යනු සාමූහික සංකල්ප හිරගෙවල්. පුදුමය නම් මිනිසුන් තම හිරගෙවල්වලට කැමති වීමයි. එයට හේතුව, ඒ හිරගෙවල් ඔවුනට සුරක්ෂිත හැඟීමක් සහ ‘මා දන්නවා‘ කියන ව්‍යාජ හැඟීමක් ලබාදීමයි.“ එතුමා තවදුරටත් ලියයි. (පහත සඳහන් කරන කාරණය කෙරෙහි ද ඔබගේ අවධානය යොමුකළ යුතුයැයි හඟිමි. කරණීයමෙත්ත සූත්‍රයේ එන: ‘දිට්ඨිංච අනුපගම්ම‘ යන්න වල්පොල රාහුල හිමියන් ඇතුළු සියලු දෙනා විසින් ම ‘වැරදි දෘෂ්ටිවලට නොවැටී‘ යනුවෙන් සිංහලට පෙරලා ඇත. සැබවින් ම බුදුන්වහන්සේ උගන් වන්නේ නිවන් අවබෝධය පිණිස **හරි** හෝ **වැරදි** කිසි ම දෘෂ්ටියකට නො වැටී සිටිය යුතු බවයි! ඔරුව කරට නොගන්නැයි උන්වහන්සේ අපට උගන් වන්නේ එබැවිනි)

එකාර්ට් ටෝලේ මෙසේ ද සඳහන් කරයි: “අභ්‍යන්තර වශයෙන් මෙම මොහොත සමග පෙළගැසීම/එකතුවීම දුකෙහි අවසානයයි. ඔබ දුක් විඳල නැත්නම් මනුෂ්‍යයකු හැටියට ඔබ තුළ ගැඹුරක් නැහැ, නිහතමානී බවක් නැහැ, කරුණාවක් නැහැ. ඔබ මේ මොහොතේ මේ පොත කියවන්නෙ නැහැ. දුක විසින් මමත්වය යන කවචය පලා විවර කරනව. ඉන් පසු එය එහි කාර්යය ඉටුකර හමාර කරනව. දුක අවශ්‍ය වන්නේ ඔබ තව දුරටත් එය අවශ්‍ය නොවන බව අවබෝධ කරගන්නා තුරු පමණයි.“

මෙහි දී බුදුන් වහන්සේ **දුක්ඛං අරිය සච්චං** යනුවෙන් **උතුම් දුක** ගැන කළ සඳහන කෙරෙහි ඔබේ අවධානය යොමුකරවනු කැමැත්තෙමි.

“ජීවිතයට ඉඩ හරින්න; ඊට පවතින්නට ඉඩ දෙන්න.“ එකාර්ට් ටෝලේ තවදුරටත් කියයි.

පොතේ එන හැම වැකියක් ම ඔබට ආධ්‍යාත්මික අවබෝධය ලබා දෙතියි කිවහොත් එය පමණ ඉක්මවා කීමක් හෙවත් අතිශයෝක්තියක් නොවේ.

පාඨක ඔබ තුළ පොත කියවීමෙහි ආශාව අවුළුවනු පිණිස ඉහත උපුටා දැක්වීම් කළෙමි.

තව එක් කාරණයක් සඳහන් කරනු කැමැත්තෙමි. පරිවර්තිකාව මෙම පරිවර්තනයේ දී ඇට යම් යම් අය විසින් දෙන ලද උපදෙස් කෙරෙහි වුවමනාවට වැඩි අවධානයක් යොමුකළ නිසාදෝ ඈ සිය පළමු පරිවර්තනයේ දී ප්‍රකටකළ ‘ගලාගෙන යන‘ බස ඇගේ දෙවන කෘතියේ යම් යම් තැන්වල දී හමුනොවන බව කීම ඇට කරන ආසාධාරණයක් නොවෙතියි සිතමි. දෙවන මුද්‍රණයක දී වඩා ස්වාධීනව තමාගේ ම බසකින් එම ඇවැසි වෙනස්කම් කරතොත් කෘතිය මීටත් වඩා සාර්ථක වනු ඇතැයි මට හැඟේ.

අප මෙම ලිපියෙහි කතාකළ සතිය, නිහැඬියාව සහ සංහිඳියාව පිළිබඳ ව මසිතේ පහළවූ කෙටි කවියක් දක්වන්නට මට අවසර දෙන්න:

අවස්ථා තුනක්

ගසක් තිබේ මා යනෙන මාවත
එය කුමක් දැයි නොදනී ම සිත
(පෘථග්ජන)
එක් දිනක් බැලුවෙමි ගස දෙස
දැන් දනිමි කුමක්දැයි එම ගස
(සමථ)
එසේ බැලීම පුරුද්දකට ගිය බැවිනි
ගස හා මා එකක් යැයි මට වැටහිණ
(විදර්ශනා)

මණ්ඩාවල පඤ්ඤාවංස හිමි
mdpannawansa@gmail.com
වොෂින්ටන් බෞද්ධ විහාරයේදීය
දෙසැම්බර් 31. 2012